# <u>ලංසු කැඳවීම</u>

## <u>2026 සිට 2027 වසර දක්වා කාලසීමාව තුළ D.P විජේසිංහ මාවත, පැලවත්ත, බත්තරමුල්ල පිහිටි ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම</u>

2026 සිට 2027 වසර දක්වා කාලය තුළ D.P විජේසිංහ මාවත, පැලවත්ත, බත්තරමුල්ල පිහිටි ඉදිකිරීම් **යන්ත්‍රෝපකරණ** පුහුණු මධ්‍යස්ථානය (CETRAC) වෙත පහත සඳහන් පරිදි ආහාර සැපයුම් සේවා සැපයීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

**1. සුදුසුකම් ලැබීමේ නිර්ණායක:**

- **1.1.** 2026.08.07 දිනට වසර තුනක (03) කාලසීමාවක් පුරා ආහාර සැපයුම් සේවා ක්ෂේත්‍රයේ නියැලී සිටින, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ලියාපදිංචි කර ඇති පිළිගත් ආහාර සපයන්නන්/හෝටල් හිමියන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. ව්‍යාපාර ලියාපදිංචිය සහ ඉටුකරන ලද පූර්ව සේවා පළපුරුද්ද පිළිබඳ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ (ඇමුණුම I).

**2. පොදු නියමයන් සහ කොන්දේසි:**

පොදු නියමයන් සහ කොන්දේසි ඇමුණුම II හි ඇතුළත් වේ.

**3. මිල ලේඛනය:**

ලංසුකරුවන් ඇමුණුම II මිල ලේඛනයට අනුව මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. සියලුම දේශීය බදු ඇතුළත්ව ඉදිරිපත් කරන මිල ගණන් ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් විය යුතු අතර එය ලංසුවේ වලංගු කාලසීමාව අවසන් දින දක්වා වලංගු විය යුතුය. ලංසුවේ වලංගු කාලසීමාව තුළ මිල ගණන් වෙනස් නොකර තබා ගත යුතුය.

**4. ලංසු ඇපකරය (Bid Guarantee):**

ලංසුකරු විසින් ලංසුව වසා දමන දින සිට දින දර්ශන දින 90 ක් දක්වා වලංගු වන පරිදි රු. 50,000.00 ක මුදලක ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. එය ඇමුණුම III හි දක්වා ඇති ආකෘතියට අනුකූලව ලබාගත් බැංකු ඇපකරයක් හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත නිකුත් කරන ලද බැංකු අණකරයක් (Bank Draft) විය යුතුය. ලංසු විවෘත කරන අවස්ථාවේදී ලංසු ඇපකරය ඉදිරිපත් කිරීමට තිබිය යුතුය.

**5. කාර්යසාධන ඇපකරය (Performance Guarantee):**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපිය නිකුත් කළ දින සිට දින දර්ශන දින 14 ක් ඇතුළත, සාර්ථක ලංසුකරු විසින් කොන්ත්‍රාත්තුව නිසි ලෙස ඉටු කිරීම වෙනුවෙන් රු. 300,000.00 ක මුදලක් සඳහා ඇමුණුම IV හි ආකෘතියට අනුකූලව කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර එය ලංසුවේ වලංගු කාලසීමාව අවසන් දින දක්වා වලංගු විය යුතුය. එවැනි කාර්යසාධන ඇපකරයක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත නිකුත් කරන ලද බැංකු ඇපකරයක් විය යුතු අතර එය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සභාපති වෙත යොමු කළ යුතුය. ඉහත සඳහන් පරිදි අවශ්‍ය කාර්යසාධන ඇපකරය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සාර්ථක ලංසුකරුවෙකු කොන්ත්‍රාත්තුව භාර ගැනීමට අකමැති අයෙකු ලෙස සලකනු ලබන අතර, ඔවුන්ගේ ලංසු ඇපකරය රාජසන්තක කරනු ලැබේ.

**6. කොන්ත්‍රාත් ගිවිසුමට අත්සන් තැබීම:**

සාර්ථක ලංසුකරු විසින් කොන්ත්‍රාත් පිරිනැමීමේ ලිපිය ලැබී මාසයක් ඇතුළත ආහාර සැපයුම් සේවා සැපයීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතුය.

**7. ගෙවීම් ක්‍රමය:**

- **i.** සියලුම ගෙවීම් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ එහි පසුකාලීන සංශෝධන හා ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නිවේදනවලට අනුව අදාළ වන පවතින බදුවලට යටත් වේ. ගෙවීම් කොන්දේසි පහත පරිදි වේ: ඉන්වොයිසි (Invoices) ලැබී දින දර්ශන දින දහහතරක් (14) ඇතුළත සහ අදාළ අධ්‍යක්ෂවරයාගේ පරීක්ෂාව සහ නිර්දේශ මත ගෙවීම් කරනු ලැබේ. ආහාර සපයන්නන් විසින් සේවාව සපයා සතියකට නොවැඩි කාලයක් ඇතුළත වැඩසටහන් පදනම මත ගෙවීම් සඳහා ඉන්වොයිසි ඉදිරිපත් කළ යුතුය.

- **ii.** සාර්ථක ලංසුකරු විසින් එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (තිබේ නම්) ඉදිරිපත් කළ යුතුය.

**8. අවශ්‍ය ලේඛන:**

❖ ලංසුව සමඟ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය:

**i.** නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකාව (ලේඛනය B).

**ii.** 2026.08.07 දිනට වසර තුනක (03) කාලසීමාවක් පුරා ලබා ඇති පූර්ව පළපුරුද්ද සඳහා වන ලේඛනමය සාක්ෂි, සේවාලාභියාගේ නම, සේවා කාලය, සේවාවන්හි ස්වභාවය, සාමාන්‍ය මාසික කොන්ත්‍රාත් මිල සහ සම්බන්ධ කර ගත හැකි පුද්ගලයාගේ විස්තර සමඟ (ඇමුණුම I).

iii. ආහාර ද්‍රව්‍යවල පිරිවිතරයන් සහිත මිල ලේඛනය (ඇමුණුම II).

iv. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු ඇපකරය (ඇමුණුම III ට සමාන).

V ආසන්න වසර 03ක් සඳහා වන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පිටපත්.

vi. අදාළ පරිදි ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය / සමාගමක ලියාපදිංචි සහතිකය / සංස්ථාගත කිරීමේ සහතිකය / හවුල් ව්‍යාපාර හෝ ඒකාබද්ධ කිරීම් පිළිබඳ සහතිකවල පිටපතක්.

**9. තේරීමේ ක්‍රමය:**

- **i.** සේවා සපයන්නා/සපයන්නන් තේරීම පිරිවැය සහ ගුණාත්මකභාවය මත පදනම් වේ.

- **ii.** ලැබෙන ඕනෑම මිල ගණන් කැඳවීමක් හෝ සියලුම මිල ගණන් කැඳවීම් භාර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අයිතිය ඇති අතර, අවම මිල ගණන් කැඳවීම භාර ගැනීමට බැඳී නැත.

- **iii.** කොන්ත්‍රාත්තුව පිරිනැමීම සම්බන්ධයෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ තීරණය අවසාන තීරණය වේ.

- **iv.** නිශ්චිත කාල සීමාව තුළ සේවාවන් සැපයීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරු තෝරා ගත හැකිය. තවද, කොන්ත්‍රාත්තුවේ මූලික කාලය වසරක් වන අතර, සැපයුම්කරුගේ කාර්යසාධනය පිළිබඳව අදාළ අධ්‍යක්ෂවරයා සෑහීමකට පත් වුවහොත් එම නියමයන් සහ කොන්දේසි යටතේම තවත් අමතර වසරක් සඳහා එය දීර්ඝ කළ හැකිය.

**10. පශ්චාත් සුදුසුකම් අවශ්‍යතා:**

ලංසුකරු විසින් මුළු කාලසීමාව පුරාම කොන්ත්‍රාත්තුව සාර්ථකව ඉටු කිරීම සඳහා තමන් සතුව යහපත් මූල්‍ය තත්ත්වයක් පවතින බව පෙන්විය යුතු අතර, එය පශ්චාත් සුදුසුකම් අවශ්‍යතාවයක් (Post Qualification Requirement) ලෙස ඇගයීමට ලක් කෙරේ.

**11. ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු විවෘත කිරීම:**

සුරක්ෂිතව මුද්‍රා තැබූ කවරවල බහා, කවරයේ ඉහළ වම් කෙළවරේ "2026/2027වසර සඳහා ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම " යනුවෙන් සහ ලංසුකරුගේ නම සඳහන් කර පහත පරිදි ඉදිරිපත් කළ යුතුය:

- **සභාපති- ප්‍රසම්පාදන මණ්ඩලය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය "සව්සිරිපාය", 123, විජේරාම මාවත, කොළඹ 07** වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**නැතහොත්**

- 2026.08.07 දින පස්වරු 2:30 ට පෙර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහලේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

ලංසු ෆෝරම් පත්‍රිකා 2026.08.07 දින පස්වරු 2:30 ට ලංසුව වසා ඇමූ වහාම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ දී විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසුව විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය.

**12. සම්බන්ධ කර ගැනීමේ විස්තර:**

වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා ඔබට පහත නිලධාරීන් සම්බන්ධ කර ගත හැක:

- **සැපයුම් නිළධාරි** (ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය)
  **0112 699801 /0112 695965**
- **සහකාර අධ්‍යක්ෂ / පරිපාලන නිළධාරි** (මානව සම්පත් හා පරිපාලන - සීට්‍රැක් ආයතනය )
  **0112 784413 / 0112 786829**

**සභාපති,**
**ප්‍රසම්පාදන මණ්ඩලය**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**"සව්සිරිපාය",**
**123, විජේරාම මාවත,**
**කොළඹ 07**